Build Future ..... Restore Past

# කාර්ය සාධන වාර්තාව- 2015



ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය

## පටුන

හැඳින්වීම ........ 3
සංස්ථානික තොරතුරු ........ 3
දැක්ම ........ 4
මෙහෙවර ........ 4
තත්ත්ව ප්‍රතිපත්තිය ........ 4
අධිකාරිය සහ වගකීම ........ 5
දෙපාර්තමේන්තුවේ සහතිකය ........ 5
කළමනාකාරීත්වය ........ 6
සපයන සේවාවන් ........ 7
ප්‍රාදේශීය කාර්යාල ........ 8
අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය ........ 9
2015 දක්වා අතීත කාර්ය සාධනය ........ 10
2015 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය ........ 11
උපදේශන අංශයේ කාර්ය සාධනය ........ 12
ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - 2015 ........ 13
අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රකාශනය-2015 ........ 13
වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය -2015 ........ 14
යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන -2016 ........ 15
කලාපීය කාර්ය සාධනය ........ 16
කලාපය 1 ඉදිකිරීම් ........ 16
කාර්ය සාධනය ........ 16
සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 16
කලාපය 1 නඩත්තු ........ 17
කාර්ය සාධනය ........ 17
සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 17

කලාපය 2 ........ 18
කාර්ය සාධනය ........ 18
සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 18
කලාපය 3 ........ 19
කාර්ය සාධනය ........ 19
සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 19
කලාපය 4 ........ 20
කාර්ය සාධනය ........ 20
සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 20
කලාපය 5 ........ 21
කාර්ය සාධනය ........ 21
සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 21
කලාපය 6 ........ 22
කාර්ය සාධනය ........ 22
සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 22
මානව සම්පත් ........ 23
මානව සම්පත්-ශක්තිය ........ 24
ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය ........ 25
විගණකාධිපති වාර්තාව ........ 26

පැතිකඩ

## හැඳින්වීම


රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී ස්ථාපිත කරන ලද අතර දශක 4 ක පමණ කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස පවතී. මෙම දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය සහ උපදේශන ආයතනය වෙයි. ඉදිකිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ එම වැඩසටහන් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගයන් සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂඥ උපදෙස් ගැනීම පිණිස එය කැඳවනු ලබයි.

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය, මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගැසට් නිවේදනය තුළ දක්වා ඇත. ජාතික සංවර්ධනය තුළ සහ රාජ්‍ය ගොඩනැගිලි වත්කම් සංරක්ෂණයේදී දෙපාර්තමේන්තුව අනගිභවනීය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කළ 13 වෙනි සංශෝධනයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කෙරිණි. ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ වගකීම සම්බන්ධව අධිකාරිය සහ වගකීම ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවටයි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ISO 9001:2008 තත්ව සහතිකයලබා ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික වගවීම වෙත විශේෂ අවධානයක් යෙදවීම තුළින්දෙපාර්තමේන්තුව තම වගකීම ප්‍රති අර්ථකථනය කරයි.

## සංස්ථානික තොරතුරු

| | | |
|---|---|---|
| **නම** | - | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| **නෛතිකත්ත්වය** | - | සම්පූර්ණයෙන්ම රජයට හිමිය |
| **අමාත්‍යාංශය** | - | නිවාස සහ ඉදිකිරීම් |
| **කාර්යාලය** | - | දෙවන මහල |
| | | සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| | | ශ්‍රී ලංකාව |
| | | දුර. 94 11 2862588 ෆැක්ස්. 94 11 2864771 |
| | | විද්‍යුත් තැපෑල dgb@buildingsdept.gov.lk |
| | | වෙබ්. www.buildingsdept.gov.lk |



දැක්ම

# දැක්ම

ජාතියට ගුණාත්මකභාවයෙන් ඉහළ සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය අංශයේ ආයතන සතුව ආරක්ෂිත, අරපිරිමැසුම් දායක, තිරසර සහ දර්ශනීය ඉදිකිරීම් පරිසරයක් තිබෙන බව සහතික කිරීම පිණිස ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන්හි තාක්ෂණික බල අධිකාරිය බවට පත්වීම.

මෙහෙවර

# මෙහෙවර

කැපවීමෙන් කටයුතුකරන, විවිධ ක්ෂේත්‍රවල නිපුණ, වෘත්තීයවේදීන් කණ්ඩායමක් විසින් පාර්ශවකරුවන්ගේ පූර්ණ සංතෘප්තිය උදෙසා ගුණාත්මකභාවය පිළිබඳ තාක්ෂණික වගවීම, සකසුරුවම, ක්‍රියාකාරීත්වය සහ මනා තත්වය සහතික කරමින් වාස්තු විද්‍යාත්මක නිර්මාණ, ඉංජිනේරු සැලසුම්, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සහාය සපයාදීම මගින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි කටයුතු සංවර්ධනය සඳහා විශිෂ්ඨ සේවාවවක් සැපයීම.

ප්‍රතිපත්තිය

# තත්ත්ව ප්‍රතිපත්තිය

පහත තත්ත්වයන් සපුරමින් රාජ්‍ය අංශයේ ගොඩනැගීම් වැඩකටයුතු සංවර්ධනය සඳහා අනගිභවනීය සේවයක් සැපයීමේ වගකීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතු වෙයි.

- අපේක්ෂාවන් අභිබවා යන වෘත්තීමය සේවාවක් සැපයීම තුළින් සේවාදායකයින් තෘප්තිමත් කිරීම.
- සේවාදායක ප්‍රතිපෝෂණයන් අධීක්ෂණය කිරීමෙන් සහ දැනුම යාවත්කාලීන කරගනිමින් අපගේ සේවාව වැඩි දියුණු කරගැනීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීම.
- කණ්ඩායම් වැඩ කටයුතු තුළින් අපගේ බහුආංශික වෘත්තිකයන්ගේ පූර්ණ සහභාගීත්වය ලබාගැනීම.
- ISO 9001:2008 තත්ව කළමනාකරණ පද්ධතියේ අවශ්‍යතාවයන් සමග අනුගත වීම සහ අඛණ්ඩව QMS වැඩි දියුණු කිරීම.

අධිකාරි

# අධිකාරිය සහ වගකීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මූල්‍ය රෙගුලාසි අංක 787, 788, 789 සහ 790 යටතේ බලතල පැවරී ඇත. ඒ අනුව, තාක්ෂණික නොවන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සඳහා දෙපාර්තමේන්තුව පහත වගකීම් දරයි.

1. රජයේ දෙපාර්තමේන්තු සහ නියෝජිතායතනවල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍යප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම්, තක්සේරු සහ ඉදිකිරීම් සහ අදාළ පහසුකම් සැපයීම.
2. ගොඩනැගීම් සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම.
3. රජයේ ගොඩනැගිලිවල නඩත්තු කටයුතු, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම්.
4. රජයේ රෝහල්වල මල ප්‍රවාහන පද්ධති නඩත්තුව, මෙහෙයුම හා එහි මනා ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම.
5. රජයේ නිවාසවල නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු
6. දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සියලු ගොඩනැගීම් කටයුතුවල තාක්ෂණික වගවීම තහවුරු කිරීම.
7. විදේශ දූත මණ්ඩල ව්‍යාපෘති.

අපගේ බැඳියාවන් සමග වඩාත් අනුගත වීම පිණිස දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් මගින් ඵකඟතාවයකට පැමිණ සේවාවන් සපයනු ලැබේ.

සහතිකය

# දෙපාර්තමේන්තුවේ සහතිකය

*වටිනාකම*

*තාක්ෂණිකව සහ මූල්‍යමය වශයෙන් වගකීම බාරගැනීම මගින් සේවා ලාභියා මුහුණපාන අවදානම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් අවම කර තමන් සිදුකරන ඉදිකිරීම සඳහා වටිනාකම තහවුරු කර සේවා ලාභියාට ආයුකාලය පුරා පවතින සහතිකවීමක් ලබා දෙයි.*

සේවාදායකයාගේ තාක්ෂණික සහ කළමනාකරණ ධාරිතාව සලකා බලමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සක්‍රිය සහයක් ලබාදෙනු ලබේ. ඉදිකිරීම් සඳහා සහතිකයක් ලබාදීමට ඇති අවශ්‍යතාවය අපි අගය කරන අතර පහත ක්‍රියාමාර්ග තුළින් අවදානම ශූන්‍ය කරගැනීමට වගකියන්නෙමු:

a. *යාවජීව තාක්ෂණික/මූල්‍ය වගවීම*
b. සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා බලයලත් ඉහළම වෘත්තිකයන් වෙතින් සැලසුම්
c. සියලුම රීති,රෙගුලාසි සහ තත්ව හා ආරක්ෂක ප්‍රමිතීන්ට අනුගත වේ
d. අතීත අත්දැකීම් භාවිතා කරමින් විශේෂයෙන් සංවර්ධනය කර ඇති නිරවද්‍ය විෂය පථය
e. අනෙකුත් සේවා සපයන්නන්ගේ සැලසුම්, ලේඛන යනාදිය පරීක්ෂා කර තත්ත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම
f. *කොන්ත්‍රාත් කළමනාකරණය කිරීම*
g. අත්දැකීම්ලත් වෘත්තීය ව්‍යාපෘති කළමනාකරණ සේවය විසින් තහවුරු කළ අගය
h. කළමනාකරණ විගණනවල මතුවන ගැටළුවලදී සහය ලබාදීම
**i.** ගිවිසුම් නීතිමය කටයුතුවලදී සහය ලබාදීම
j. තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසම්පාදන කමිටුවලට සහභාගි වී තාක්ෂණික සහය ලබාදීම

# කළමනාකාරීත්වය

කළමනාකාරීත්වය

| | | |
|---|---|---|
| **ඉංජි.එම්.ආර්.ජෙයචන්ද්‍රන්** | - | අධ්‍යක්ෂ ජනරාල් |
| **ඉංජිනේරු. එම්.බී. හේමදාස** | - | වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා) |
| **වාස්තු විද්‍යාඥ සන්ධ්‍යා මෙන්ඩිස් මහත්මිය** | - | වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන සේවා) |
| **ඉංජි.එම්.එච්.එම්.ඉස්මයිල්** | - | අධ්‍යක්ෂ (ඉංජිනේරු සැලසුම්) |
| **එස්.ඩී. ශ්‍රීමාලි අතාවුදආරච්චි මිය** | - | අධ්‍යක්ෂ (පරිපාලන) |
| **ජේ.ඒ. ගර්ලි මහත්මිය** | - | ප්‍රධාන ගණකාධිකාරී |
| **ඉංජි. ඩබ්.ඒ.ඩබ්. අබේවර්ධන මහත්මිය** | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් කලාපය 1) |
| **ඉංජි ඒ.නවාස් අතම්** | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් කලාපය 2) |
| **ඉංජි කේ.ජී සන්ධ්‍යා කුමුදුනී මහත්මිය** | - | අධ්‍යක්ෂ (තාක්ෂණික සංවර්ධන) |
| **එස්.නරසිංහ මෙය** | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| **වාස්තු විද්‍යාඥ මේනක මංගලනාථ** | - | වැඩ බලන අධ්‍යක්ෂ (වාස්තු විද්‍යාඥ) |

සේවාව

# සපයන සේවාවන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සේවා දායකයන්ට තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හා තම ගොඩනැගිලි, යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාක්ෂාත් කරගැනීමේ ලා ඇතිවෙන ධාරිතා පරතරය පිරවීමට කටයුතු කරයි.

**ව්‍යාපෘති යෝජනා (මෙහි කාර්යය වන්නේ සේවාදායකයා හඳුනාගත් ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමයි)**

ව්‍යාපෘති අනුමැතීන් ලබාගැනීමට සහ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහය වීම පිණිස සේවාදායකයන් සඳහා ව්‍යාපෘති සාරාංශ, ශක්‍යතා වාර්තා, පිරිවැය ඇස්තමේන්තු සහ තාක්ෂණික සහය ලබාදීම අපි සිදුකරන්නෙමු.

**කාර්ය නිෂ්ඨාව (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)**

සැලසුම් සැකසීම, සම්පූර්ණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන සියල්ල සඳහා අපි සම්පූර්ණ වගකීම භාරගන්නෙමු. සේවාදායකයාට ඇත්තේ සිදුවිය යුතු සියල්ල සිදුවීමට අවශ්‍ය යතුර යෙදීම පමණි.

මූල්‍ය රෙගුලාසිවල දක්වා ඇති පරිදි, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට නිකුත් කෙරුණු චෙක් පතක් හෝ වැය ශීර්ෂයක් මාරු කිරීමෙන්, ගොඩනැගිලි දෙපාර්තුමේන්තුවට අරමුදල් නිකුත් කෙරේ.

**උපදේශනය (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)**

අප විසින් පූර්ව කොන්ත්‍රාත් වගකීම ලෙස ශක්‍යතා වාර්තා සැකසීම, සැලසුම් නිර්මාණය කිරීම, ප්‍රමාණ පත්‍ර සැකසීම සහ ලංසු ලේඛණකරණය කරනු ලබන අතර පශ්චාත් කොන්ත්‍රාත් වගකීම ලෙස ඉදිකිරීම් කළමණාකරණ සේවාවන් සපයනු ලැබේ. ලංසු ක්‍රියාවලියේ වගකීම සේවාදායකයා විසින් ගනු ලැබේ.

අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

**ව්‍යාපෘති කළමනාකරණය (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ/ උපදේශක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)**

කොන්ත්‍රාත් නියෝජිතායතන වෙත උපදේශනය සැපයීමේ වගකීම අප විසින් ගනු ලැබේ. ක්‍රියාත්මක කිරීමට භාරගැනීම හෝ ඒ සඳහා සේවාදායකයාට උපදෙස් දීම සිදු කෙරේ. BOT (ඉදිකිරීම, මෙහෙයවීම හා පැවරීම), BOOT (ඉදිකිරීම, හිමිකරගැනීම, මෙහෙයවීම සහ පැවරීම) යටතේ පුද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන් සහ රජයේ හෝ ප්‍රදායක නියෝජිතායතනවල නිර්මිත සහ ගොඩනැගීම් කොන්ත්‍රාත් අප විසින් භාරගනු ලැබේ.

අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

**නඩත්තුව, විශේෂ අලුත්වැඩියා, වැඩිදියුණු කිරීම් (කාර්ය භාරය වනුයේ සේවාදායකයාට පහසුකම් සැපයීමයි)**

තත්ව වාර්තා සැකසීම, නඩත්තු අත්පොත් සැකසීම, නඩත්තු ඇස්තමේන්තු සැකසීම, නඩත්තු ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමට භාරගනු ලැබේ.

සිදු කෙරෙන කටයුතු සඳහා අරමුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිකුත් කෙරේ.


**ලබාදෙන වෙනත් සේවාවන්.**

අනෙක් ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් ලෙස නිසි නිලධාරීන් පත්කර ඒ සඳහා සහභාගි වෙනු ලැබේ.

## සේවාව

*“දිවයිනේ ස්ථාන හයක පිහිටා ඇති කලාපීය කාර්යාල හත හරහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සිය සේවාලාභීන්ට සේවා සපයනු ලබයි..”*

# ප්‍රාදේශීය කාර්යාල




*රූපය1-කලාප බෙදීමේ සිතියම*

# අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය

### ජාතික සංවර්ධනයට සිදුකර ඇති දායකත්වය

රටතුළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදු කෙරෙන සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ පූර්ණ දායකත්වය ලබාදෙන ලදී. ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා අවශ්‍ය කරන ව්‍යාපෘති කළමනාකරණ සේවා වැඩි වශයෙන් සැපයීමට දෙපාර්තමේන්තුව සමත් විය.

### ISO 9001:2008 තත්ව සහතිකය ලබාගැනීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ මහනුවර ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 05) **ISO 9001:2008** තත්ව ක්‍රියාත්මක කරමින් පවතී.

අනෙකුත් ප්‍රාදේශීය කාර්යාලද **ISO** තත්ව සහතිකය ලබාගැනීම සඳහා අදාළ ලේඛන සූදානම් කරමින් සිටිනු ලැබේ.

### ප්‍රගති සාරාංශය


2015 වර්ෂය තුළ අපේක්ෂිත අගයන්ට සාපේක්ෂව සමස්ථ මූල්‍ය ප්‍රගති ප්‍රතිශතය 76% ක් වේ.

### 2015වර්ෂයේදී මුහුණ දෙනලද බාධක

- කාර්යමණ්ඩලය හිඟවීම
  - ඉංජිනේරුවරුන්,ගෘහ නිර්මාණ ශිල්පීන් සහ ප්‍රමාණ සමීක්ෂකයන්
  - තාක්ෂණික නිලධාරීන් සහ සැලසුම්කරුවන්
  - රාජ්‍ය කළමනාකරණ සහායකයින්
  - රියදුරන්
- වැඩපලවල් කරා යාම සඳහා වාහන හිඟකම
- හදිසි ව්‍යාපෘති සඳහා පැවරුම් පදනමින් උපදේශක සේවා ලබාගැනීම සඳහා අවසර නොමැතිවීම
- සංචාරක බංගලා නඩත්තුව/ වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් නොතිබීම
- අත්හිටවූ ව්‍යාපෘති සඳහා ගෙවීම් සිදු නොකිරීම
- ඉදිකිරීම් අදියරේදී සේවාදායකයින් විසින් ඉල්ලාසිටින වෙනස්කිරීම් හේතුවෙන් ව්‍යාපෘති ප්‍රමාදවීම
- කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රමාණවත් සම්පත් නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති නිසි කලට සම්පූර්ණ කිරීමට ඇති අපහසුතා

**ඉංජිනේරු.එම්.ආර්.ජෙයචන්ද්‍රන්**
අධ්‍යක්ෂජෙනරාල්
ගොඩනැගිලි දෙපාර්තමෙන්තුවේ

# 2015 දක්වා අතීත කාර්ය සාධනය




*රූපය 2:පසුගිය වසර පහ හා සංසන්දනය*

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජයේ ආයතනවල සේවාදායකයින්ට සේවාවන් සපයනු ලබයි. දෙපාර්තමේන්තුව වෙතින් සපයන ප්‍රධාන සේවාවන්, නව ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය ලෙස වර්ගීකරණය කළ හැකිය. රූපය 2 මගින් පෙන්වා දී ඇති පරිදි දෙපාර්තමේන්තුව 2010 වසරේ වූ මිලියන 516 ක කාර්ය සාධනයේ සිට 2015 මිලියන 2303 දක්වා වර්ධනය වී ඇති අතර ඒ අනුව 2010 සිට 2015 දක්වා කාර්ය සාධනයේ වැඩිවීම 346% කි. 2010 වසරේ සිට 2015 දක්වා වාර්ෂික වර්ධනය 1 වගුවේ දක්වා ඇත.

*වගුව 1: 2010-2015 දක්වා වාර්ෂික වර්ධනය*

| වසර | වාර්ෂික කාර්යසාධනය (මිලියන) | වර්ධනය % (පදනම් වර්ෂය 2010) | වර්ධනය % (පදනම් වර්ෂය, පෙර වසර) |
|---|---|---|---|
| **2010** | 516.42 | | |
| **2011** | 632.95 | 23% | 23% |
| **2012** | 621.12 | 20% | -2% |
| **2013** | 1339.22 | 159% | 115% |
| **2014** | 1523.01 | 195% | 14% |
| **2015** | 2303.81 | 346% | 51% |

වගුව 2 මගින් දක්වා ඇති පරිදි 2014 සිට 2015 දක්වා දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය මිලියන 1523 සිට 2303 දක්වා වර්ධනය වී ඇත. පහත වගුව 2 මගින් ප්‍රතිසංස්කරණය සහ නව ගොඩනැගිලි යන ක්ෂේත්‍රවල කාර්ය සාධනය පෙන්වයි. 2014 සිට 2015 දක්වා කාලය තුළ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 5% කින්ද නව ගොඩනැගිලි ඉදිකිරීම් 65% කින්ද වර්ධනය වී ඇත.

*වගුව 2 වාර්ෂික කාර්ය සාධනයේ ආංශික සන්සන්දනය*

| අංශය | වාර්ෂික කාර්යසාධනය (මිලියන) | | ප්‍රතිශත වැඩිවීම |
|---|---|---|---|
| | 2014 | 2015 | |
| ප්‍රතිසංස්කරණ | 344.80 | 363.13 | 5% |
| නව ගොඩනැගිලි | 1178.21 | 1940.68 | 65% |
| එකතුව | **1523.01** | **2303.81** | **51%** |

## 2015 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය

තුන්වන වගුවේ දක්වා ඇති පරිදි දෙපාර්තමේන්තුව විසින් 2015 වසරේ දී ව්‍යාපෘති 283ක් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ අතුරින් ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 25 ට අඩු ව්‍යාපෘති 198 ක් ද, ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන (25-100)ත් අතර, ව්‍යාපෘති 45ක් ද, ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන (100-200)ත් අතර ව්‍යාපෘති 18ක් ද, රුපියල් මිලියන 200ට වැඩි ව්‍යාපෘති 22ක් ද, විය.

වගුව 3 2015 වසරේ ඉදිකිරීම් අංශයේ සාරාංශය


| කලාප කාර්යාලය | ව්‍යාපෘති වටිනාකම රු. මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | **0-25** | **25-100** | **100-200** | **>200** | එකතුව |
| කලාප 1 ඉදිකිරීම් | 5 | 11 | 4 | 4 | 24 |
| කලාප 1 නඩත්තු | 62 | 2 | 1 | 1 | 66 |
| කලාප 2 | 12 | 9 | 2 | 4 | 27 |
| කලාප 3 | 14 | 7 | 3 | 3 | 27 |
| කලාප 4 | 51 | 10 | 2 | 5 | 68 |
| කලාප 5 | 34 | 4 | 2 | 2 | 42 |
| කලාප 6 | 20 | 2 | 4 | 3 | 29 |
| එකතුව | **198** | **45** | **18** | **22** | **283** |

# උපදේශන අංශයේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවන්ගේ මධ්‍යය වන්නේ උපදේශන අංශයයි. මෙම අංශය විසින් ගොඩනැගිලි සහ අදාළ යටිතල පහසුකම් සඳහා වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විදුලි, ජල සැපයුම් හා ජලාපවාහන සහ යාන්ත්‍රික නිමැවුම් යනාදී ආකාරවලින් සේවාවන් සපයන අතර ප්‍රමාණ පත්‍රද සකස් කරනු ලබයි. ඉහත සේවාවන් සපයනුයේ ඒ සඳහා කැපවූ වෘත්තීමය වාස්තු විද්‍යාඥයන් සහ ඉංජිනේරුවරුන් විසිනි. මෙම අංශය 2013 වසරේ මිලියන 2700 ක කාර්ය සාධනයක් පෙන්වූ අතර 2014 දී එය මිලියන 3308 ක්ද 2015 වසරේදී මිලියන 4342 ක්දවිය. පහත 4 වගුව 2015 වසරේ කාර්ය සාධනයන් ප්‍රමාණය පෙන්වන අතර 2013 සිට 2015 දක්වා කාර්ය සාධනය 3 වන රූපය මගින් පෙන්වයි.

*වගුව 4 :2015 වසරේදී ව්‍යාපෘති උපදේශන අංශයේ සාරාංශය*


| අංකය | විස්තරය | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. (මිලියන) |
|---|---|---|---|
| 1 | සැලසුම් අදියර සම්පූර්ණ කළ ව්‍යාපෘති | 74 | |
| 2 | සේවාදායක අනුමතිය සඳහා යවන ලද දළ සැලසුම් | 111 | |
| 3 | ඉදිකිරීම් සැලසුම් අදියරේ පවතින ව්‍යාපෘති | 20 | |
| 4 | 2015 වසරේ අවසානයේදී සකස් කරමින් පැවැති දළ සැලසුම් | 19 | |
| 5 | 2015 වසරේ අවසානයේදී විමර්ශන අදියරේ පැවැති ව්‍යාපෘති | 26 | |
| 6 | ව්‍යාපෘති කළමනාකරණ උපදේශන කාර්යය | 06 | |
| | **මුළු ව්‍යාපෘති සංඛ්‍යාව** | **256** | **4342.00** |




| | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| ඉලක්කය(රු. මිලියන) | 0 | 3240 | 3900 |
| ප්‍රගතිය (රු. මිලියන) | 2700 | 3308 | 4342 |

රූපය 3 :උපදේශන අංශයේ කාර්ය සාධනයේ ප්‍රස්ථාරමය ඉදිරිපත් කිරීම


# ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - 2015




| | ප්‍රාග්ධන අයවැය | පුනරාවර්තන අයවැය | එකතුව |
|---|---|---|---|
| වාර්ෂික ඇස්තමේන්තුව (රු. මිලියන) | 52.40 | 254.60 | 307.00 |
| පරිපූරක ප්‍රතිපාදන (රු. මිලියන) | 0.00 | 38.30 | 38.30 |
| එකතුව (රු.මිලියන) | 52.40 | 292.90 | 345.30 |
| වියදම | 52.22 | 286.73 | 338.96 |

රූපය 4:ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්වල ප්‍රස්ථාරමය ඉදිරිපත් කිරීම

# අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රකාශනය- 2015




| | උපරිම වියදම් සීමාව | ලැබීම් අවම සීමාව | හර ශේෂයේ උපරිම සීමාව |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත සීමා (රු. මිලියන) | 20.00 | 9.00 | 95.00 |
| ලැබුණු සීමා (රු. මිලියන) | 20.87 | 11.87 | 75.00 |
| තථ්‍ය වියදම/ලැබීම් | 15.92 | 17.87 | 43.52 |

*රූපය 5: අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රස්ථාරමය ඉදිරිපත් කිරීම*

# වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය -2015


| | | කාර්ය නිෂ්පාදව | | උපදේශන | | ව්‍යාපෘති කළමනාකරණය | | නඩත්තුව | | වැඩිදියුණු කිරීම් | | ප්‍රතිසංස්කරණ | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික% | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික % | මූල්‍ය (මිලියන) | භෞතික % |
| කලාප 1 ඉදිකිරීම් | ඉලක්කය | 109.66 | 100 | 243.71 | 100 | 148.91 | 100 | - | - | - | - | - | - | **502.28** | **100** |
| | තථ්‍ය | 97.85 | 74 | 154.63 | 48 | 129.20 | 28 | - | - | - | - | - | - | **381.68** | **48** |
| කලාප 1 නඩත්තු | ඉලක්කය | 11.31 | 100 | 79.62 | 100 | - | - | 21.33 | 100 | 226.24 | 100 | 38.04 | 100 | **376.54** | **100** |
| | තථ්‍ය | 12.21 | 79 | 65.00 | 75 | - | - | 24.77 | 100 | 187.88 | 85 | 36.62 | 38 | **326.48** | **79** |
| කලාප 2 | ඉලක්කය | 116.55 | 100 | 197.11 | 100 | 275.15 | 100 | - | - | - | - | - | - | **588.81** | **100** |
| | තථ්‍ය | 104.96 | 94 | 133.13 | 40 | 262.20 | 95 | 6.15 | 100 | - | - | - | - | **506.44** | **80** |
| කලාප 3 | ඉලක්කය | 167.00 | 100 | 86.86 | 100 | - | - | 11.92 | 100 | 22.86 | 100 | 3.41 | 100 | **292.05** | **100** |
| | තථ්‍ය | 127.80 | 76 | 58.60 | 66 | - | - | 12.57 | 100 | 18.68 | 87 | 2.00 | 56 | **219.65** | **75** |
| කලාප 4 | ඉලක්කය | 80.43 | 100 | 428.49 | 100 | 75 | 100 | - | - | - | - | - | - | **583.92** | **100** |
| | තථ්‍ය | 39.45 | 49 | 194.81 | 45 | 69 | 91 | - | - | - | - | - | - | **303.26** | **56** |
| කලාප 5 | ඉලක්කය | 143.81 | 100 | 116.05 | 100 | 128.84 | 100 | 33.12 | 100 | - | - | - | - | **421.82** | **100** |
| | තථ්‍ය | 162.23 | 97 | 123.23 | 100 | 60.00 | 47 | 38.67 | 100 | - | - | - | - | **384.13** | **90** |
| කලාප 6 | ඉලක්කය | 50.00 | 100 | - | - | 150.00 | 100 | 35.24 | 100 | 6.96 | 100 | - | - | **242.20** | **100** |
| | තථ්‍ය | 39.68 | 79 | - | - | 106.71 | 53 | 35.43 | 100 | 0.96 | 10 | - | - | **182.78** | **68** |
| එකතුව | ඉලක්කය | 678.76 | 100 | 1151.84 | 100 | 777.90 | 100 | 101.60 | 100 | 256.06 | 100 | 41.45 | 100 | **3002.28** | **100** |
| | තථ්‍ය | 584.18 | 83 | 729.40 | 58 | 627.11 | 69 | 111.65 | 100 | 207.52 | 84 | 38.62 | 39 | **2303.81** | **76** |

# යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන -2016

| | | කාර්ය නිෂ්ඨාව | | උපදේශන | | ව්‍යාපෘති කළමනාකරණය | | නඩත්තුව | | වැඩිදියුණු කිරීම් | | ප්‍රතිසංස්කරණ | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % | මුල්‍ය (මිලියන) | භෞතික % |
| කලාප 1 ඉදිකිරීම් | ඉලක්කය | 138.95 | 100 | 1451.24 | 100 | - | - | - | - | - | - | - | - | 1590.19 | 100 |
| | තථ්‍ය | | | | | | | | | | | | | | |
| කලාප 1 නඩත්තු | ඉලක්කය | 3.14 | 100 | 28.14 | 100 | - | - | 19.02 | 100 | 77.92 | 100 | 105.27 | 100 | 233.49 | 100 |
| | තථ්‍ය | | | | | | | | | | | | | | |
| කලාප 2 | ඉලක්කය | 110.40 | 100 | 590.57 | 100 | 60.50 | 100 | - | - | - | - | - | - | 761.47 | 100 |
| | තථ්‍ය | | | | | | | | | | | | | | |
| කලාප 3 | ඉලක්කය | 197.10 | 100 | 380.88 | 100 | - | - | 61.87 | 100 | 1.00 | 100 | - | - | 620.85 | 100 |
| | තථ්‍ය | | | | | | | | | | | | | | |
| කලාප 4 | ඉලක්කය | 245.74 | 100 | 265.90 | 100 | 108.44 | 100 | - | - | - | - | - | - | 620.08 | 100 |
| | තථ්‍ය | | | | | | | | | | | | | | |
| කලාප 5 | ඉලක්කය | 90.91 | 100 | 118.79 | 100 | 68.84 | 100 | 26.09 | 100 | - | - | - | - | 304.23 | 100 |
| | තථ්‍ය | | | | | | | | | | | | | | |
| කලාප 6 | ඉලක්කය | 88.92 | 100 | 30.00 | 100 | 326.09 | 100 | 21.87 | 100 | - | - | - | - | 466.89 | 100 |
| | තථ්‍ය | | | | | | | | | | | | | | |
| එකතුව | ඉලක්කය | 874.76 | | 2845.52 | | 563.87 | | 128.85 | | 78.92 | | 105.27 | | 4597.19 | 100 |
| | තථ්‍ය | | | | | | | | | | | | | | |

# කලාපීය කාර්ය සාධනය
# කලාපය 1 ඉදිකිරීම්

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජිනේරු එස්.එස්. රත්වත්ත |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි.ජී.එච්.එන්.එන්. පෙරේරා |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 1 ඉදිකිරීම්) කාර්යාලය,<br>අංක. 213<br>ටොරිංටන් ඇවනියු<br>කොළඹ 07 |
| දුරකථන 94 11 554691 | ෆැක්ස් 94 11 2554690 |
| විද්‍යුත් තැපෑල | cecc@buildingsdept.gov.lk |




# කාර්ය සාධනය


*වගුව 5- ප්‍රගති සාරාංශය ප්‍රධාන ඉංජිනේරු (කලාප 1 - ඉදිකිරීම්) කාර්යාලය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | එකතුව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 109.66 | 243.71 | 1079.72 | **1433.09** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 97.85 | 154.63 | 1009.20 | **1261.68** |
| නිමාකරන ලද ව්‍යාපෘති (සංඛ්‍යාව) | - | 1 | 3 | **4** |
| ක්‍රියාත්මක අදියරේ පවතින ව්‍යාපෘති (සංඛ්‍යාව) | 10 | 9 | 2 | **21** |

# සම්පූර්ණ කළ ව්‍යාපෘති

| බුලත්සිංහලප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉදිකිරීම. | | දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීම | |
|---|---|---|---|
| මුළු ඇස්තමේන්තුගත පිරිවැය | 79.90 මිලියන | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | 98.00 මිලියන |
| සේවාදායක | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,බුලත්සිංහල | සේවාදායක | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
|  | |  | |

# කලාපය 1 නඩත්තු

| | | |
|---|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි එම්. සත්‍යකුමාර්** |  |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි එස්.එම්.එම්. සිරිවර්ධන | |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය<br>(කලාපය 1 නඩත්තු)<br>අංක 213<br>ටොරින්ටන් පටුමග<br>කොළඹ 07 | |
| **දුර.94 11 2582579** | ෆැක්ස් 94 11 2588686 | |
| **විද්‍යුත් තැපෑල** | cem@buildingsdept.gov.lk | |




# කාර්ය සාධනය

*වගුව 6- ප්‍රගති සාරාංශය ප්‍රධාන ඉංජිනේරු (කලාප 1 - නඩත්තු) කාර්යාලය*


| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | නඩත්තු | වැඩි දියුණු කිරීම් | ප්‍රතිසංස්කරණය | එකතුව |
|---|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය(රුපියල් මිලියන) | 11.31 | 79.62 | 21.33 | 226.24 | 38.04 | **376.54** |
| මූල්‍ය ප්‍රගතිය(රුපියල් මිලියන) | 12.21 | 65.00 | 24.17 | 187.88 | 36.62 | **325.88** |
| **නිමාකරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව** | 2 | - | 12 | 166 | 2 | **182** |
| **ඉදිකිරීම් අදියරේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව** | 1 | 2 | - | 22 | 6 | **31** |

# සම්පූර්ණ කළ ව්‍යාපෘති

| මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කාමර අංක 208 හි වැඩිදියුණු කිරීම | | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කාමර අංක 321හි වැඩිදියුණු කිරීම | |
|---|---|---|---|
| මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 11.14 | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 17.67 |
| සේවාදායක | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | සේවාදායක | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය |
|  | |  | |

# කලාපය 2

| | |
|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි. එස්. විනෝද්නී (මිය)** |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි. කේ. තිරුකුමාර් |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරුකාර්යාලය (කලාපය 2 ) වෙරළ පාර, ගුරුනගර්, යාපනය. |
| දුරකථන. **94 21 2222781** | ෆැක්ස් 94 21 2222781 |
| **විද්‍යුත් තැපෑල** | cej@buildingsdept.gov.lk |




# කාර්ය සාධනය


*වගුව 7- ප්‍රගති සාරාංශය ප්‍රධාන ඉංජිනේරු (කලාප 2) කාර්යාලය*

| | කාර්ය නිෂ්යාව | උපදේශන | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය(රුපියල් මිලියන) | 116.55 | 197.11 | 275.15 | - | **588.81** |
| මූල්‍ය ප්‍රගතිය(රුපියල් මිලියන) | 104.96 | 133.13 | 262.20 | 6.15 | **506.44** |
| නිමාකරන ලද ව්‍යාපෘතිසංඛ්‍යාව | 4 | 3 | 4 | 1 | **12** |
| ඉදිකිරීම් අදියරේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | 2 | 5 | 5 | - | **12** |

# සම්පූර්ණ කළ ව්‍යාපෘති

| කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම, කම්කරු දෙපාර්තමේන්තුව | | බන්ධනාගාර සංකීර්ණය ඉදිකිරීම (2 වන අදියර) යාපනය | |
|---|---|---|---|
| මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 67.08 | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 317.00 |
| සේවාදායක | කම්කරු දෙපාර්තමේන්තුව | සේවාදායක | බන්ධනාගාර දෙපාර්තමේන්තුව |
|  | |  | |

## කලාපය 3

| | | |
|---|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි. ජී.ආර්.එස්.බී. ගම්ලත්** |   |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි.එස්.සුරේන්ද්‍රන් | |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාපය 3 ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, කුරුණෑගල | |
| **දුර.94 37 2222197** | ෆැක්ස් 94 37 2222437 | |
| **විද්‍යුත් තැපෑල** | **cek@buildingsdept.gov.lk** | |

## කාර්ය සාධනය

*වගුව 8- ප්‍රගති සාරාංශය ප්‍රධාන ඉංජිනේරු (කලාප 3) කාර්යාලය*


| | කාර්ය නිෂ්පාව | උපදේශන | නඩත්තු | වැඩිදියුණු කිරීම | ප්‍රතිසංස්කරණ | එකතුව |
|---|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 167.00 | 86.86 | 11.92 | 22.86 | 3.41 | **292.05** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 127.80 | 58.60 | 12.57 | 18.68 | 2.00 | **219.65** |
| නිමාකරන ලද ව්‍යාපෘතිසංඛ්‍යාව | 1 | 4 | 5 | 2 | - | **12** |
| ඉදිකිරීම් අදියරේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | 7 | 4 | - | 3 | 1 | **15** |

## සම්පූර්ණ කළ ව්‍යාපෘති

| **දිවා සුරකුම් මධ්‍යස්ථානයක් සහ පෙර පාසලක් ඉදිකිරීම, අනුරාධපුර** | | **ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය සඳහා පිරිමි සහ කාන්තා ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම** | |
|---|---|---|---|
| **මුළු ඇස්තමේන්තුගත පිරිවැය** | මිලියන 33.03 | **මුළු ඇස්තමේන්තුගත පිරිවැය** | මිලියන 100.00 |
| **සේවාදායක** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර | **සේවාදායක** | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය |
|  | |  | |

## කලාපය 4

| | |
|---|---|
| **ප්‍රධාන ඉංජිනේරු** | **ඉංජි. කේ. ඉලන්කෝ** |
| **නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු** | ඉංජි. එස්. තුෂාන්ති (මෙය) |
| **කාර්යාලය** | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාපය 4 ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ඉඟිනියාගල පාර, අම්පාර |
| **දුර.94 63 2224490** | ෆැක්ස් 94 63 2222437 |
| **විද්‍යුත් තැපැල** | ceu@buildingsdept.gov.lk |




## කාර්ය සාධනය

*වගුව 9 - ප්‍රගති සාරාංශය ප්‍රධාන ඉංජිනේරු (කලාප 4) කාර්යාලය*

| | කාර්ය නිෂ්යාව | උපදේශන | ව්‍යාපෘති කළමනාකරණය | එකතුව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 80.43 | 428.49 | 75.00 | **583.92** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 39.45 | 194.81 | 69.00 | **303.26** |
| නිමාකරන ලද ව්‍යාපෘතිසංඛ්‍යාව | 4 | 26 | - | **30** |
| ඉදිකිරීම් අදියරේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | 11 | 24 | 3 | **38** |


## සම්පූර්ණ කළ ව්‍යාපෘති

| නව ළමා සුරතුම් මධ්‍යස්ථානය ඉදිකිරීම, අම්පාර මහ රෝහල | | විවාහක වෛද්‍යවරුන්ගේ නිල නිවාස 04 ක් ඉදිකිරීම, අම්පාර මහ රෝහලේ | |
|---|---|---|---|
| මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 22.64 | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 33.08 |
| සේවාදායක | සෞඛ්‍ය අමාත්‍යාංශය | සේවාදායක | සෞඛ්‍ය අමාත්‍යාංශය |





## කලාපය 5

| | | |
|---|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි එන්.එම්.එම්. මරික්කාර් මිය |  |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි ඩී.සී.විජේසිංහ මිය | |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාපය 5 ) ගොඩනැගිලි පාර්තමේන්තුව, මහනුවර | |
| දුර.94 81223 4255 | ෆැක්ස් 94 81 2234255 | |
| විද්‍යුත් තැපැල | cec@buildingsdept.gov.lk | |

## කාර්ය සාධනය


*වගුව 10 - ප්‍රගති සාරාංශය ප්‍රධාන ඉංජිනේරු (කලාප 5) කාර්යාලය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශන | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තු | එකතුව |
|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 143.81 | 116.05 | 128.84 | 33.12 | **421.82** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 162.23 | 123.23 | 60.00 | 38.67 | **384.13** |
| නිමාකරන ලද ව්‍යාපෘතිසංඛ්‍යාව | 3 | 1 | - | 13 | **18** |
| ඉදිකිරීම් අදියරේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | 3 | 3 | 1 | 14 | **11** |

## සම්පූර්ණ කළ ව්‍යාපෘති

| මහනුවර මහ නගර සභාවේ ඩී.එස්.සේනානායක පුස්තකාලයේ ඇමෙරිකන් අංශය ප්‍රතිසංස්කරණය | | හන්තාන මූලික අධ්‍යයන ආයතනයේ විද්‍යාගාරය හා රථගාල සඳහා මහල් 04ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම | |
|---|---|---|---|
| මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 37.86 | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 174.00 |
| සේවාදායක | මහනුවර මහ නගර සභාව | සේවාදායක | මූලික අධ්‍යයන ජාතික ආයතනය, හන්තාන |
|  | |  | |

# කලාපය 6

| | | |
|---|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. කේ ලියනගේ මිය |  |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි කේ.පී.ඒ. ගුනවර්ධන | |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාපය 6 )<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>අංක 10, ඉහළ ඩික්සන් පාර,<br>ගාල්ල | |
| දුර.94 91 223 4838 | ෆැක්ස් 94 91 223 4838 | |
| විද්‍යුත් තැපෑල | ceg@buildingsdept.gov.lk | |

# කාර්ය සාධනය

*වගුව 11-ප්‍රගති සාරාංශය ප්‍රධාන ඉංජිනේරු (කලාප 6) කාර්යාලය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශන | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තු | නඩත්තු | එකතුව |
|---|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 50.00 | - | 15.00 | 29.90 | 6.96 | **236.86** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 39.68 | - | 106.71 | 30.09 | 0.96 | **177.44** |
| නිමාකරන ලද ව්‍යාපෘතිසංඛ්‍යාව | 4 | - | 1 | 12 | - | **17** |
| ඉදිකිරීම් අදියරේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | 3 | 2 | 7 | - | 1 | **13** |

# සම්පූර්ණ කළ ව්‍යාපෘති

| දික්වැල්ල වැවුරුකන්නල පූජා භූමියේ බිම් මහලේ සාප්පු 06ක් ඉදිකිරීම | | වී පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, අම්බලන්තොට | |
|---|---|---|---|
| මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 10.00 | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 89.01 |
| සේවාදායක | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- මාතර | සේවාදායක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
|  | |  | |

## මානව සම්පත්

| කළමනාකරණ කාර්ය මණ්ඩලය | අනුමත | පිරවූ | පුරප්පාඩු | මෙහෙයුම් කාර්ය මණ්ඩලය | අනුමත | පිරවූ | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | - | ප්‍රධාන ඉංජිනේරු | 15 | 6 | 9 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජි.සේ) | 1 | - | 1 | ජ්‍යෙෂ්ඨ වාස්තු විද්‍යාඥ | 2 | - | 2 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන) | 1 | - | 1 | ඉංජිනේරු | 70 | 37 | 33 |
| අධ්‍යක්ෂ- ඉංජිනේරු සැලසුම් | 1 | 1 | - | වාස්තු විද්‍යාඥ/ අභ්‍යන්තර අලංකරණ ශිල්පී | 12 | 10 | 2 |
| අධ්‍යක්ෂ-(වාස්තු විද්‍යා) | 1 | 1 | - | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 1 | - | 1 |
| අධ්‍යක්ෂ - තාක්ෂණ සංවර්ධන | 1 | 1 | - | පරිපාලන නිලධාරී | 1 | - | 1 |
| අධ්‍යක්ෂ ඉදිකිරීම් | 2 | 2 | - | තාක්ෂණ නිලධාරී | 90 | 53 | 37 |
| අධ්‍යක්ෂ පරිපාලන | 1 | 1 | - | සැලසුම් ශිල්පී | 40 | 29 | 11 |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - | තාක්ෂණික සහකාර | 40 | - | 40 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | - | ප්‍රමාණ සමීක්ෂණ සහකාර | 13 | 13 | - |
| නියෝජ්‍යඅධ්‍යක්ෂ පරිපාලන | 1 | 1 | - | සංවර්ධන නිලධාරී | 37 | 32 | 5 |
| ගණකාධිකාරී | 5 | 3 | 2 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 80 | 55 | 25 |
| **එකතුව** | **17** | **13** | **4** | **එකතුව** | **401** | **236** | 166 |
| | | | | **වෙනත්** | **180** | 134 | 46 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **අනුමත සේවක සංඛ්‍යාව** | **581** | **දැනට සිටින** | **383** | **පුරප්පාඩු** | **198** |

## මානව සම්පත්-ශක්තිය

දෙපාර්තමේන්තුව සතු අතිමහත් ශක්තිය වන්නේ සිවිල්, විදුලි සහ යාන්ත්‍රික ක්ෂේත්‍රයන් ගේ වරලත් ඉංජිනේරුවරුන් සහ වරලත් වාස්තු විද්‍යාඥයන්, අභ්‍යන්තර නිර්මාණ ශිල්පීන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය යනාදී බහු වෘත්තික කාර්ය මණ්ඩලයයි.

ප්‍රධාන ඉංජිනේරුවන් 06 දෙනෙක්, ඉංජිනේරුවන් 37ක්, වාස්තු විද්‍යාඥ/අභ්‍යන්තර නිර්මාණ ශිල්පීන් 10, තාක්ෂණ නිලධාරීන් 53, සැලසුම් ශිල්පීන් 29 ක් හා ප්‍රමාණ සමීක්ෂණ සහකරුවන් 13 කගෙන් සමන්විත වෘත්තීය ඒකක ගණනාව වෘත්තීමය ලෙස යොදාගනිමින් දෙපාර්තමේන්තුව තම සේවය ලබා දෙයි.

ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත වැඩකටයුතුවල උපදේශන ආයතනය සහ පූර්ණ බලාධිකාරිය ලෙස මෙම වෘත්තීය කණ්ඩායම ගොඩනැගිලි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී  සහ ඒවායේ නීතිමය කටයුතු සම්බන්ධයෙන් විශේෂඥ උපදෙස් ලබාදීම සඳහා කැඳවනු ලබයි.

ඵලදායී නායකත්වය, සේවකයන් අතර සහයෝගය වැඩි කර ඉලක්ක සැපිරීම සඳහා සම්පත් යොදාගනිමින් ජයග්‍රහණ කරා ළඟා වීමට ඉවහල් වෙයි.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හැකියාවෙන් පිරි, ස්ථාවර සහ සක්‍රිය නායකත්වයක් ලැබීමේ භාග්‍යය උදාකරගෙන ඇති අතර, ඔවුන් නොමැතිනම් ප්‍රගතිය සිහිනයක් වනු ඇත.

මෙහි පවතින එකම තර්ජනය වන්නේ පුද්ගලික අංශය සහ විදේශයන්හි පවතින ආකර්ෂණය හේතුවෙන් තාක්ෂණික කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුව හැර යාමයි.

සංවිධානයේ වර්ධනය, ඵලදායීතාව සහ කාර්යක්ෂම බව වැඩි කරන මෙවන් තාක්ෂණිකව නිපුණ වෘත්තීය කාර්ය මණ්ඩලය රඳවාගැනීම සඳහා දිරි දීමනා සැලසුමක් හෝ සම්මානයට ලක් කිරීමේ ක්‍රමයක් තිබිය යුතුය.

# ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය

## අභ්‍යන්තර විගණන අංශය

**වගකීම**

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දැක්ම,මෙහෙවර හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණනය තුළින් දෙපාර්තමේන්තුවේ වගවීම ඉහළ නැංවීම හා වටිනාකම් එකතු කිරීම සඳහා ස්වාධීන හා අරමුණු කරා ලගාවීමට අවශ්‍ය සේවා සැපයීම.

**අරමුණු**

1. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලන ක්‍රම ඵලදායී බව ඉහල නැංවීම සඳහා දායකවීම.
2. විගණනය හා කළමනාකරණ කමිටු මඟින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.
3. විශේෂ විමර්ශනය කටයුතු තුළින් දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරීත්වයට නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
4. සමාලෝචිත වර්ෂය සඳහා අනුමත විගණක සැලැස්මට අනුව විගණනයන් කර ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරීම.

**කාර්යයන්**

2008.01.25 දිනැති අංක 08/00200/306/012 දරණ අමාත්‍යාංශ මණ්ඩල තීරණ අනුව ස්ථාපිත විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ DMA/2009 (1) දරන 2009/06/09 දිනැති චක්‍රෛලේඛයේ උපදෙස් හා 2014.09.09 රාජ්‍ය ගිණුම් කාරක සභා නිර්දේශයන් අනුව 2015 ජූනි මස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කරන ලදී.

**2015/12/31 දිනට කාර්ය මණ්ඩලය**

| තනතුර | නිත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී. ලං.ග.සේ) | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| කා.කා.ස | 01 |

**භෞතික කාර්ය සාධනය**

1. සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටුව අනුමත කරන ලද අභ්‍යන්තර විගණන සැලසුම අමාත්‍යාශය වෙත හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදුව අනුමතවී ඇත.
2. අභ්‍යන්තර විගණන වාර්තා 25 ක් ඉදිරිපත් කරනු ලැබ ඇත.මෙම වාර්තා වල සම්පිණ්ඩිත පිටපත් තුන් මසකට වරක් අමාත්‍යාංශය වෙත හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
3. සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පවත්වා ඇත.

# විගණකාධිපති වාර්තාව

**ශීර්ෂය 309- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 17 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 21. විසර්ජන ගිණුම

### මුළු ප්‍රතිපාදනය හා වියදම

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 345.30 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 338.96 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.34 ක් හෙවත් සියයට 1.84 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | දිනට 31 දෙසැම්බර් 2014 | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 292.90 | 286.73 | 6.17 | 2.11 |
| මූලධන | 52.40 | 52.23 | 0.17 | 0.32 |
| **එකතුව** | **345.30** | **338.96** | **6.34** | **1.84** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 20.87 | 13.40 | 11.87 | 14.73 | 75.00 | 44.07 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7000/0000/00/0067/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 2.22 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 845.93 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0016/0033/000 | 112.81 |
| 6000/0000/00/0013/0052/000 | 732.37 |
| 6000/0000/00/0002/0012/000 | 0.75 |
| **එකතුව** | **845.93** |

## 2.5 විගණන නිරීක්ෂණය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

### 3.2 අයවැය විචලනය

---

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 78 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

---

විෂය අංක 30901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී වර්ෂ 1 කට වැඩි හා වර්ෂ 2 කට වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු.335,530 ක හිඟහිටි ණය ශේෂ දෙකක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

### 3.4 පොදු තැන්පත් ගිණුම

---

වර්ෂ 2 ක් ඉක්මවූ රු.මිලියන 50.86 ක් වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.5 කාර්යසාධනය

---

2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂාවෙන් සැලැස්මට ඇතුළත් කර තිබූ ව්‍යාපෘති අතරින් පහත සඳහන් ව්‍යාපෘතිවල කිසිදු කාර්යසාධනයක් සිදු කර නොතිබුණි.

| ව්‍යාපෘති වර්ගය | ඇස්තමේන්තුගත වියදම | ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති සංඛ්‍යාව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ගණනේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. මිලියන | | |
| Turnkey | 85.36 | 13 | 25.4 |
| Consultancy | 83.44 | 18 | 23.6 |
| Project Management | 209.9 | 05 | 20.4 |

**3.6 අවිධිමත් ගනුදෙනු**

2014 ඔක්තෝබර් 21 දිනැති අංක PRE/2014/TR-01 දරන මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව මැතිවරණ රාජකාරි සඳහා මුදා නොහළ සංචිත වාහනයක් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට මැතිවරණ රාජකාරි සඳහා රැගෙන යාමට ලබා දී තිබුණි. 2015 ජනවාරි 07 දින සිදුවූ අනතුරකින් පසු අළුත්වැඩියා කිරීම සඳහා රු.112,992 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. එම වාහනය මැතිවරණ රාජකාරි සඳහා යොදවාගත් නිලධාරියා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ රාජකාරි ආවරණය කළ නිලධාරියෙකු වූ අතර, උක්ත කාලපරිච්ඡේදය සඳහා එම නිලධාරියා ප්‍රවාහන හා ඉන්ධන දීමනා ද ලබා ගෙන තිබුණි. එවැනි දීමනා ලබන නිලධාරියෙකුට සංචිත වාහන පාවිච්චි කිරීමේ හැකියාවක් නොමැති වුවත්, උක්ත අලාභය අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.7 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(ආ) 2014 ජුලි 19 දින දෙපාර්තමේන්තුවට අයත් වාහනයකට සිදු වී තිබුණු අලාභහානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු නොකර රු.247,000 ක අලාභය පොත්වලින් කපා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කර තිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් අපහරණය කිරීමේදී නිලධාරින් නිසි සැලකිල්ලෙන් කටයුතු නොකිරීම නිසා දෙපාර්තමේන්තුවට රු.322,050 ක අලාභයක් සිදුවී තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 116 | 66 | 50 | - |
| (ii) | තෘතියික මට්ටම | 23 | 05 | 18 | - |
| (iii) | ද්විතියික මට්ටම | 281 | 179 | 102 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 178 | 123 | 45 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 23 | - | 23 |
| | **එකතුව** | **598** | **421** | **193** | **23** |